**විභාග නීතිරීති**

1. **විභාගයට අයදුම් කිරීම**

විභාගයට මාස 3කට පෙර අන්තර්ජාලය හරහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා අදාළ වාරික මුදල් හෝ නැවත පෙනී සිටීම සඳහා විභාග ගාස්තු ගෙවා අයදුම් කළ යුතුය. නියමිත කාලය තුළදීම අයදුම්පත් යොමු කිරීම සිදු කළ යුතුය.

2. **විභාග කාලසටහන**

විභාගය පැවැත්වීමට මාසයකට පෙර තාවකාලික කාල සටහන නිකුත් කරනු ලබන අතර අවශ්‍යතා අනුව සංශෝධනය විය හැක. විභාගයට සති දෙකකට පෙර ස්ථිර කාලසටහන හා විභාග ප්‍රවේශ පත්‍රය අන්තර්ජාලය හරහා නිකුත් කරනු ලැබේ.

3. **විභාගයට පෙනී නොසිටීම**

විභාගය සඳහා අයදුම් කරන සෑම විද්‍යාර්ථියෙකු ම සියලු ම පාඨමාලා ඒකක සඳහා අනිවාර්යෙන් ම විභාගයට පෙනී සිටිය යුතු ය. කිසියම් පාඨමාලා ඒකකයකට පෙනී නොසිටීම පිළිබඳ ව විශ්වවිද්‍යාලයීය අභියාචනා මණ්ඩලයට පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් නොකර, විභාගයට පෙනී නොසිටියහොත් අදාළ විභාගයට නැවත පෙනී සිටින විට උපරිම ලකුණු 40ක් (C සාමාර්ථයක්) පමණක් ලැබේ.

4. **අභියාචනා ඉදිරිපත් කිරීම**

නොවැළැක්විය හැකි හේතුවක් නිසා ප්‍රථම වරට විභාගයට පෙනී සිටීමට නොහැකි වූ සිසුන්ට අභියාචනා ඉදිරිපත් කිරීම මඟින් ප්‍රථම වරට පෙනී සිටින අපේක්ෂකයකු ලෙස අදාළ විභාගයට පෙනී සිටීමට අවස්ථාව ඇත. ඒ සඳහා අභියාචනා කමිටුවට පිළිගත හැකි හේතු පැහැදිලි කරමින් ලිපියක් ඉදිරිපත් කළ යුතු ය. අසමත් වූ විෂය ඒකක සඳහා මෙය වලංගු නොවේ.

5. **අසමත් වූ විෂයයන් සඳහා නැවත පෙනී සිටීම**

කිසියම් පාඨමාලා ඒකකයට C ශ්‍රේණියට පහළ (C-/D+/D/E) ශ්‍රේණි ලබා ගත් විද්‍යාර්ථියෙකුට උපරිම වශයෙන් C ශ්‍රේණියක් ලබා ගැනීම සඳහා නැවත විභාගයට පෙනී සිටිය හැකි ය. මෙහි දී විද්‍යාර්ථියා ලබා ගත් ශ්‍රේණියට වඩා පහළ ශ්‍රේණියක් ලබා ගතහොත් කලින් තිබූ ශ්‍රේණිය ම උපාධියට ගණනය කරනු ලැබේ.

6. **උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ලැබෙන කාලය**

අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 7 ක් ඇතුළත උපාධිය සම්පූර්ණ කළ යුතු අතර පන්ති සාමාර්ථ ලබා ගැනීමේ දී එය අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 3 ක් විය යුතු ය. එසේ වුව ද අධ්‍යයන වර්ෂ 10 ක උපරිමයකට යටත්ව අසමත් පාඨමාලා ඒකක සම්පූර්ණ කර ගැනීම සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමේ අවස්ථා ඇත.

7. **ලියා පදිංචියෙන් පසු විභාගයට පෙනී සිටීම**

7.1. <u>ශිෂ්‍ය ලියාපදිංචිය ලබාගත් දිනයේ සිටම අධ්‍යයන වර්ෂය ආරම්භ වන අතර අදාළ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට යටත්ව සෑම අපේක්ෂකයෙකුම සාමාන්‍ය උපාධිය සඳහා අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 3 ක් හා ගෞරව උපාධිය සඳහා අඛණ්ඩ අධ්‍යයන වර්ෂ 4 ක් තුළ ඒ ඒ උපාධි පාඨමාලාවට අදාළ වර්ෂ අවසාන පරීක්ෂණවලට පෙනී සිටිය යුතුය.</u> එම කාලය තුළ උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වුවහොත් නැවත විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු (Repeater) ලෙස වසර 7 ක් තුළ උපාධිය සම්පූර්ණ කර ගැනීමට සිදු වනු ඇත. එසේ වුව ද අභියාචනා මත තවත් වසර 3 ක කාලයක් ඒ සඳහා අවස්ථාව ලබා ගැනීමට හැකියාව ඇත.

7.2. පිළිගත හැකි වෛද්‍ය හෝ වෙනත් හේතු මත විශ්වවිද්‍යාලය මගින් අනුමැතිය දී ඇති අවස්ථාවල දී හැර සෑම අපේක්ෂකයෙකු ම තමා ලියාපදිංචි වූ සෑම විෂයයක් සඳහා ම එකවර පරීක්ෂණ වලට පෙනී සිටිය යුතුය.

7.3. අනුමත වෛද්‍ය හේතුන් මත නැවත පරීක්ෂණ වලට පෙනී සිටින අපේක්ෂකයන් ද නියමිත සම්පූර්ණ විභාග ගාස්තු සහ ලියාපදිංචි දීර්ඝ කිරීමේ ගාස්තු ගෙවිය යුතුය.

7.4. යම් අපේක්ෂකයෙකු විශ්වවිද්‍යාලයේ අභියාචනා කමිටුව විසින් අනුමත කළ හේතුවක් මත එක් විභාගයකට නියමිත අධ්‍යයන වර්ෂය තුළ පෙනී සිටීමට අපොහොසත් වුවහොත් ඊළඟට එළඹෙන අධ්‍යයන වර්ෂය තුළ පෙර පෙනී සිටීමට නොහැකි වූ විභාගයට සහ පෙනී සිටීමට නියමිත අධ්‍යයන වර්ෂවල විභාගවලට අපේක්ෂකයාගේ ඉල්ලීම මත සියලු අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසුව පෙනී සිටීමට අවස්ථාව ලබා දෙනු ඇත.

**8. විභාග අක්‍රමිකතා**

විභාග පැවැත්වෙන අවස්ථාවල දී අපේක්ෂකයන් විසින් සිදු කරනු ලබන අක්‍රමිකතා ඔප්පු වුවහොත්, විශ්වවිද්‍යාල පනතේ සඳහන් දඬුවම් එකක් හෝ කිහිපයක් නියම කිරීමට කැලණිය විශ්වවිද්‍යාලයට බලය පැවරී ඇත.

**9. විභාග ප්‍රතිඵල අත්හිටුවීම/තහනම් කිරීම**

කිසියම් අපේක්ෂකයෙකු විභාග අක්‍රමිකතාවයක් සිදු කළහොත් ඔහුගේ/ඇයගේ ප්‍රතිඵල අත්හිටුවනු ලැබේ.

**10. උපාධි පරීක්ෂණයේ අවසන් ප්‍රතිඵල නිකුත් කිරීම**

උපාධි පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කරනු ලබන්නේ අදාළ වර්ෂ තුන ඉකුත් වීමෙන් පසු සියලුම වර්ෂවල (ස්තර තුනේම/හතරේම) ප්‍රතිඵල සලකා බලා අවසන් ප්‍රතිඵල ගණනය කොට විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ කමිටුවේ අනුමැතිය ලැබීමෙන් අනතුරුවය.
උපාධි ප්‍රතිඵල නිකුත් කිරීමේ දී උපාධියට අවශ්‍ය සියලු අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් නැවත විභාගවලට පෙනී සිට ඌන සාමාර්ථ සම්පූර්ණ කර තිබුණ ද එම ප්‍රතිඵල අවසාන ප්‍රතිඵලයට සලකා බලනු නොලැබේ.

**11. සහතික නිකුත් කිරීම**

ලියාපදිංචි වීමෙන් පසු ප්‍රථම/දෙවන/තෙවන වසර තුළ දී විද්‍යාර්ථීන්ට අත්‍යවශ්‍ය කාරණයකට ඉල්ලීමක් කළ පසු අධ්‍යයන වාර්තාවක් (Partial Grade Report) මුදල් ගෙවා ලබා ගත හැක. අවසන් ප්‍රතිඵල නිකුත් කොට සනාතන සභාවේ අනුමැතියෙන් පසු ලබා දෙන විස්තර සහිත අධ්‍යයන සහතිකය (Academic record) උපාධිය සමත්වන සෑම විද්‍යාර්ථියෙකු සඳහාම ආයතනය මගින් නිකුත් කරන අතර එහි අතිරේක සහතික අවශ්‍යය නම් මුදල් ගෙවා ලබා ගත යුතුය. උසස් අධ්‍යාපන ආයතන සඳහා අවශ්‍යතාවය මත ලබා දෙන ලකුණු විස්තර සහිත රහස්‍ය අධ්‍යයන වාර්තාව (Academic Transcript) එම ආයතනයේ ලිපිය සමග විද්‍යාර්ථීන් විසින් ඉල්ලුම් කොට මුදල් ගෙවූ පසු එම ආයතනයට ලැබීමට සලස්වනු ඇත.

**12. උපාධි සහතික නිකුත් කිරීම**

උපාධි ප්‍රදානෝත්සවයෙන් අනතුරුව නියම කර ගන්නා දිනයන්හී කැලණිය විශ්වවිද්‍යාලය මගින් උපාධි සහතික නිකුත් කරනු ලැබේ.